**බියගම ප්‍රාදේශීය සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**
**---------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
--------------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 30 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
-------------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට බියගමප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
---------------------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ත්‍රීරෝද රථ හා යතුරුපැදි මිලදී ගැනීම සඳහා මෙතෙක් අනුමැතිය නොලැබුණු රු.5,000,000 ක මුදලක් ණයහිමි හා ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගතකළ යුතු වේ | 2020 දි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2019 වර්ෂයේ වැඩිපුර ලැබූ වැටුප් ප්‍රතිපූර්ණ මුදල් රු.11,623,517 ක් ගිණුම්වල ඉදිරියට ලැබීමක් ලෙස දැක්වීම වෙනුවට ආදායම් ණයගැතියන්ගෙන් අඩුකර දක්වා තිබුණි. තවද ලැබිය යුතු උපාධිධාරී අභ්‍යාසලාභී දීමනා හා සභික දීමනා පිළිවෙලින් රු.128,086 හා රු.1,680,000 ක් ණයගැතියන් ලෙස ගිණුම්වල පෙන්වා නොතිබුණි. | නිවැරදි අගය ගිණුම්වල දැක්විමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ඉකුත් වර්ෂ වල රු.767,794 ක වටිනාකමැති ණයගැති ශේෂ 02 ක් ගිණුම් වලින් අතහැරී තිබුණු අතර ණයගැති ශේෂ 04 කට අදාලව නිවැරදි අගයයන් ගිණුම්ගත නොවීම | නිවැරදි ණයගැති ශේෂය ගිණුමේ දැක්විමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | නිසා ණයගැතියන් රු.361,609 කින් අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පොලිතින් විකිණීමෙන් ලද ආදායම් රු.104,525 ක් හා පසුගිය වර්ෂ වල ලැබූ ආදායම් රු.31,904 ක් පොදු තැන්පතු ලෙස ගිණුම්ගතකර තිබුණි. | සියළු ආදායම් ගිණුම්ගතකළ යුතුවේ. | කොටසක් සේවකයන් අතර බෙදා දීම සඳහා පොදු තැන්පතු වශයෙන් ගිණුම්ගත කර ඇත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී පෙර පාසල්වලින් ලද ආදායම් රු.512,000 ක් හා වියදම් රු.1,149,125 ක් ගිණුම්වල පෙන්වා නොමැති අතර පෙර වර්ෂ වලදී ලැබූ ආදායම් හා වියදම්ද ගිණුම් වල පෙන්වීම වෙනුවට පොදු තැන්පතු ගිණුම්වල පෙන්වා තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේදී රු.928,075 ක ශේෂයක් පොදු තැන්පත් යටතේ ගිණුම් ගතකර තිබුණි. | සියළු ආදායම් වියදම් ගිණුම් වල පෙන්වීමට කටයුතු කළයුතු වේ. | සියලු ගණුදෙනු පොදු තැන්පත් ගිණුම මගින් ගලපා ඇත. |
| (ඊ) | වටිනාකම සඳහන් නොවූ ට්‍රැක්ටර් 02 ක්ද ටේලරයක් සහ ගල් රෝලක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | සියළු වත්කම් තක්සේරුකර ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී ගිණුම් ගතකිරීමට ක්‍රියාකරමි. |

1.3.2 **නොසැසඳුනු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 04 ක ශේෂ එකතුව රු.43,882,074 ක් වුවද, උපලේඛනය අනුව ශේෂයන්ගේ එකතු වටිනාකම රු.57,331,873 ක් වූයෙන් රු.13,449,799 ක වෙනසක් විය. | ලේඛන හා උප ලේඛන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.15,133,788 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් ශේෂය රු.12,617,319 ක් වූ බැවින් රු.2,516,469 ක වෙනසක් විය. | වෙනසට හේතු නිරීක්ෂණය කර නිවැරදි කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට ක්‍රියා කරමි. |

1.4 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු පනත වගන්ති අංක 20 | වර්ෂ 05 කට වරක් වරිපනම් තක්සේරු කළයුතු වුවද 2008 හා 2012 වර්ෂ වල තක්සේරුව පදනම් කරගෙන වරිපනම් අයකර තිබුණි. | පනත අනුව නව තක්සේරු කළයුතු වේ. | මේ වනවිට නව තක්සේරුවක් ක්‍රියාත්මක කරමින් පවති. |
| (ආ) | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙක ඉක්මවූ රු.8,919,417 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | වසර දෙක ඉක්මවූ තැන්පත් ආදායමට ගතයුතු වේ. | ඉදිරියේදි ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

1.5 **ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ**

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව වසර 1ත් 2ත් අතර රු.13,499,317 ක ණයහිමි ශේෂයක් විය. | ගෙවියයුතු ශේෂ නිරවුල් කිරිමට කටයුතු කළයුතු වේ. | 2020 වර්ෂය අවසන් වන විට ගෙවීමට ඉදිරිපත් නොවන ශේෂ කපාහැරීමට ක්‍රියා කරමි. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව වසර 1ත් 2ත් අතර රු.10.371,654 ක ණයගැති ශේෂයක් හා වසරකට අඩු රු.31,358,917 ක ණයගැති ශේෂයක් විය. | ලැබියයුතු ශේෂ අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | 2020 වර්ෂය අවසන් වන විට නොලැබෙන ශේෂ කපා හැරීමට ක්‍රියා කරමි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.88,621,019 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.142,915,121 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි මාසයේ නිකුත්කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් 03 කට අදාලව රු.64,732 ක් ප්‍රවර්තන වර්ෂය අවසානය වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි. | ශේෂය නිරවුල් කිරිමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට ක්‍රියාකරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 78,550,145 | 81,187,305 | 79,485,440 | 29,816,601 | 77,752,222 | 81,010,773 | 89,250,070 | 29,039,953 |
| කුලී | 4,972,960 | 6,711,705 | 5,827,748 | 8,770,974 | 5,058,860 | 5,101,750 | 4,677,487 | 10,916,880 |
| බලපත්‍ර ගාස්තු | 3,010,000 | 4,834,328 | 4,816,328 | 18,000 | 2,469,000 | 3,798,671 | 3,833,671 | 3,333,297 |
| වෙනත් ආදායම් | - | - | 248,809,313 | 1,176,006 | 243,621,656 | | 273,382,966 | - |
| | 86,533,105 | 92,733,338 | 338,938,829 | 39,781,581 | 328,901,738 | 89,911,194 | 371,144,194 | 43,290,130 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය ගිණුම් අනුව 46,352,623 ක් වූ අතර ඉන් රු.6,705,591 ක් අවුරුදු 10 ට වැඩි හා රු.12,734,492 ක් වසර 5 ත් 10 ත් අතර විය. | හිඟ වරිපනම් බදු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | වරිපනම් බදු අය කිරිමට පනත ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. |

2.3.3 **කඩකුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කඩවත උප කාර්යාලයට අයත් කඩ කාමර 06 කින් රු.5,324,542 ක හිඟ කඩකුලී පැවති අතර මුද්‍රා තබා ඇති කඩ 05 කට අදාලව රු.593,450 ක්ද අයකරගෙන නොතිබුණි. | හිඟ කඩ කුලී අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතු වේ. | කඩකාමර 6 කට අදාලව නඩුවක් පවතින බැවින් එම කඩ 6 ක හිඟ මුදල් අයකරගත නොහැකිව බිල් වෙමින් පවතී. මුද්‍රා තබා ඇති කඩ නැවත ටෙන්ඩර් කර නැත. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිලිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 08 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි | සභාව අදාළවන අතුරු ව්‍යවස්ථා වැලද ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අදාල වන අතුරු ව්‍යවස්ථා වැලද ගනිමි. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර අයවැය මගින් රු.29,745,305 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් ක්‍රියාකාරකම් 05 ක් ප්‍රවර්තන වර්ෂයේ ඉටුකර නොතිබුණි. | අදාල ක්‍රියාකාරකම් කඩිනමින් ඉටු කළයුතු වේ. | ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලද ව්‍යාපෘති වෙනුවට මහජන ඉල්ලීම් අනුව නව ව්‍යාපෘති සිදු කර ඇත. |

(ඇ) **පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පාරිසරික ගැටළු වලට අදාලව ප්‍රවර්තන වර්ෂයේදී මහජන පැමිණිලි 644 ක් ලැබී තිබූ අතර ඉන් පැමිණිලි 323 ක් නොවිසඳී පැවතුණි. | මහජන පැමිණිලි කඩිනමින් විසඳීමට පියවර ගත යුතු වේ. | මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරමි |

(ඉ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය අනුව බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2019 සිට 2023 දක්වා පිළියෙලකර තිබූ අතර සමස්ථ ප්‍රගතිය සියයට 50 ක් විය. | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ප්‍රගතිය 50% ක් බව පිළිගනිමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත කාර්ය මණ්ඩලය තුල ද්විතියික තනතුරු 14 ක් සහ තෘතියික තනතුරු 17 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කළ යුතු වේ. | කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇත. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂයේදී කුලී රථ සඳහා රු.12,959,960 ක මුදලක් ගෙවා තිබූ අතර ඉන් කසළ ප්‍රවාහනයට රු.5,017,900 ක් හා මාර්ග අංශයේ කටයුතු සඳහා රු.4,135,100 ක් ගෙවා තිබුණි. සභාව සතුව වාහන මිලදී ගැනීමේ හැකියාව පැවතියදී දීර්ඝ කාලයක සිට කුලී පදනම මත වාහන ලබාගෙන ගෙවීම්කර තිබුණි. | කුලී වාහන භාවිතය අවම කිරීමට පියවර ගතයුතු වේ. | ඉදිරියේදී සේවා අවශ්‍යතා අනුව වාහන මිලදී ගැනීමට ක්‍රියා කරමි. |

3.4 **වත්කම් කළමනාකරණය**

3.4.1 **පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ප්‍රවර්තන වර්ෂයේ රු.1,329,019 ක් වැයකර සියඹලාපේ දකුණ පුරාණ දේවාලය අසල ප්‍රජාශාලාවක් සංවර්ධනයකර තිබූ නමුත් එම භූමිය පවරාගෙන නොතිබුණි. | වත්කම් පවරාගැනීමට පියවර ගතයුතු වේ. | ඉදිරියේදී පවරාගැනීමට ක්‍රියා කරමි. |
| (ආ) මධ්‍යම පරිසර අධිකාරිය මගින් සභාවට ලබාදී තිබූ රු.4,716,000 ක් වටිනා වත්කම් 2020 මැයි 31 වන විටත් පවරාගැනීමට කටයුතුකර නොතිබුණි. | වත්කම් පවරාගැනීමට පියවර ගතයුතු වේ. | ඉදිරියේදී පවරාගැනීමට ක්‍රියා කරමි. |

3.4.2 **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාව සතු ඉඩම් 2 ක බාහිර පාර්ශවයන් අනවසරයෙන් පදිංචිවී තිබුණු අතර ඉඩම් 49 කට අදාලව වැට මායිම් සකස්කර නාමපුවරු සවිකර නොතිබුණි. | වත්කම් ආරක්ෂාවට පියවර ගතයුතු වේ. | ඉඩම්වලට අදාළව වැට මායිම් සකස් කිරීම හා පුවරු සවි කිරීමට ක්‍රියා කරමින් පවතී. |
| (ආ) පොදු ළිං සමීක්ෂණය අනුව ළිං 12 ක් සොයාගත නොහැකිව තිබූ අතර ළිං 2 ක් අධිවේගී මාර්ගයට අත්පත්කරගෙන තිබුණි. | වත්කම් ආරක්ෂාවට පියවර ගතයුතු වේ. | සභාව සතු දේපල සමීක්ෂණ සිදු කරමින් පවතින අතර ඒ අනුව මෙම ළිං පිළිබඳව ඉදිරි පියවර ගැනීමට ක්‍රියා කරමි. |

3.4.3 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මල්වාන, බියගම හා දෙල්ගොඩ මහජන පුස්තකාලවල රු.63,080 ක් වටිනා පොත් 153 ක් සමීක්ෂණයට ඉදිරිපත්කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අදාළ පියවරයන් ගතයුතු වේ. | ඉදිරියේදී සමීක්ෂණයට ඉදිරිපත් කරමි. |